Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

සතිය- 2 සතිය

ශ්‍රේණිය - 07

Prepared by- බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

# කුලු නැටුම හා සබැඳි සුවිශේෂී ලක්ෂණ

- වෘත්තීමය ගැමි නැටුමකි.
- කුල්ල කමතේදී භාවිතා කරනු ලබන අතර මුලුතැන්ගෙයි උපකරණයක් ලෙසද යොදා ගනී.
- කමතේදී බැත එකතු කිරීම,කාටුව පිස හැරීම,බැත හුළං කිරීම,බැත පිරවීම යන ද පිරිමි පාර්ශවය විසින් සිදු කරනු ලබයි.
- මුලුතැන්ගෙයි වැඩ කිරීමේදී සහල් පෙළීම, සහල් පූ කිරීම, ආදී කටයුතු කාන්තාවන් විසින් කුල්ල මගින් සිදු කරනු ලබයි.
- කුලු නැටුම සඳහා රත්නමාලී දෙව්දුව සම්බන්ධ රන් තෙළඹු වර්ණනාවේ එන කවි හා රත්ණවල්ලී කවි යොදා ගනී.
- කුලු නැටුම නිර්මාණයේදී කුල්ල භාවිතයට ගන්නා අවස්ථා පදනම් කර ගනිමින් අලංකාර සරල පද යොදා ගනිමින් නැටුම නිර්මාණය කළ යුතුය.

**කුලු කවි**

මාත්‍රා 3

ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ
මෑත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ
අතේ පයේ ගිගිරිද සෙල්ලි සෙල්ලියේ
කුලු සරඹෙට එනවද රත්න වල්ලියේ

බන්දවාන කුලු යතුරු තනාලා
කැන්දවාන දෙදෙනෙකුට කියාලා
ඇන්දවාන අළු යන්තරෙ ඇඳලා
කන්දෙ බැදෙන බැත පැහැපත් කරලා

ළමා ලියෝ මල් ගවසා වරල                    පිට
දමා කරට මුතුපොට අත වළලු                  වට
පෙමා වඩන ලෙස සරසා ඔසරි                  පොට
පමා නොව රඟන් කුලු ගෙන සබේ                  පිට



**ක්‍රියාකාරකම**

1. විවිධ තාල රූප වලට අනුව කුලු කවි ගායනා කරන්න.

2, කුල්ල භාවිතා කරමින් අවකාශය නිසි ලෙස භාවිත කරමින් කුලු නැටුමක් නිර්මාණය කරන්න.

3. අන්තර්ජාලය හරහා කුලු නැටුමක් නරඹා රස විඳින්න.

සැකසුම ඃ සිතාරා පවිත්‍රානි මිය

ර/ විද්‍යාකර මහා විද්‍යාලය